Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

සියලු හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
Department of Education Central Province

09 ශ්‍රේණිය | වර්ෂ අවසාන පරීක්ෂණය - 2019 | 21 S I

සිංහල භාෂාව හා සාහිත්‍යය - I | කාලය පැය දෙකයි

නම හා විභාග අංකය :

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක 1 සිට 3 දක්වා ප්‍රශ්නවල ඉරි ඇඳි පදවල අර්ථයට සමීප අර්ථය ඇති පදය තෝරන්න.

01. ඔහුගේ ප්‍රකාශයෙන් සභාවම ආන්දෝලනයට පත්විය.
1. කරදරයට 2. ප්‍රබෝධයට 3. කැළඹීමට 4. කෝපයට

02. යෞවනයන්ගේ ක්‍රියා කලාපය තුලතුනා අයගේ දෝෂ දර්ශනයට ලක්විය.
1. වයසක අයගේ 2. මැදිවියෙහි අයගේ
3. තැලී පොඩිවුණු අයගේ 4. තුන්වෙනි පන්තියේ අයගේ

03. ජංගම දුරකථනය අනිසි ලෙස භාවිතයෙහි විපාක තරුණ පිරිසට ඒත්තු ගැන්වීම අපහසුය.
1. තේරුම්කර දීම 2. පැවසීම 3. තීරණය කිරීම. 4. සිතා ගැනීම

- අංක 4 සිට 6 දක්වා ප්‍රශ්න වල හිස්තැනට සුදුසු පදය තෝරන්න.

04. ඇසේ පෙනීම දරුවෙකුගේ අධ්‍යාපනය සඳහා කොතෙක් දුරට ඉවහල්වේද යන්න සිරිසෝම .................................. දනී.
1. හදවතින් 2. ප්‍රත්‍යක්ෂයෙන් 3. අනර්ථයෙන් 4. අනවබෝධයෙන්

05. කෘෂි වගාවන්හි ගුණාත්මක භාවය .............................................. හා අස්වැන්න අනුමාන කිරීම වායුගෝලීය හා පෘථිවි සමීක්ෂණ චන්ද්‍රිකා පද්ධතියෙන් සිදු කෙරේ.
1. නිර්මාණය 2. නිර්යාතය 3. නිර්ණය 4. නිර්මාංශ

06. එම කෙටි කතාව ප්‍රථම පුරුෂ ........................................................................ රචනා වී ඇත.
1. ත්‍රිකෝණයෙන් 2. සුළු කෝණයෙන් 3. මහා කෝණයෙන් 4. දෘෂ්ටි කෝණයෙන්

- සෑම පදයකම අක්ෂර වින්‍යාසය නිවැරදිව යෙදී ඇති පද පේළිය තෝරන්න.

07. 1. දෘෂ්ටිකෝණය, පෞඪ, අන්‍යෝන්‍ය, වර්ණය
2. පිලිබිඹු, නිර්මාණශීලී, ස්මරණය, ලේකකයා
3. ඊර්ෂ්‍යාව, පෝෂනය, පරිශීලනය, ගවේෂණ
4. ශික්ෂණය, පිළිගැනීම, ප්‍රතිඵලය, ඇමති ධූරය

08. 1. සංස්කරණය, පරිහරණය, පෙරලිය, ඇතුළත්
2. වෙරල, චණ්ඩ, වෘත්තිකයා, රළ පෙළ
3. විශ්ලේෂණය, ඡේදය, තරුනයා, ශෛලිය
4. ප්‍රමුඛ, පරිමාණය, සාධාරණ, පෞරාණික

- අකාරාදී පිළිවෙල නිවැරදිව යෙදී ඇති පද පේළිය තෝරන්න.

09. 1. නාරම්පනාව, නාගදීපය, නාගස්තැන්න, නාවලපිටිය
2. රාගම, රංගල, රත්නපුර, රිකිල්ලගස්කඩ
3. කටුගස්තොට, කෑගල්ල, කිරිල්ලවල, කුරුණෑගල
4. තලාතුඔය, තුල්හිරිය, තලවකැලේ, තන්තිරිමලේ

10. පළමු අක්ෂරයේ රකාරාංශය, යංශය, ඉස්පිල්ල, ගයනුකිත්ත පිළිවෙලින් යෙදී ඇති වරණය තෝරන්න.
1. න්‍යාය, මෘදුකාංගය, වීදිය, මුදුනු
2. ප්‍රකාශය, න්‍යායාත්මක, විශ්වය, ඖෂධ
3. ග්‍රන්ථය, ව්‍යාපාරය, පෞරාණික, කුහර
4. විකාශය, මූලාසනාරූඪ, ත්‍යාග, රාශිය

11. සෑම පදයකම මහප්‍රාණ අක්ෂරයක් යෙදී ඇති වරණය තෝරන්න.
1. කණ්ඨජ, ඕෂ්ඨජ, ආරූඪ, තද්ධිත
2. පරිශීලනය, පීඨය, අඝෝෂ, ඡන්දය
3. අපේක්ෂාව, භෞතික, ශ්‍රේෂ්ඨ, ග්‍රන්ථ
4. උපාධිය, නිෂ්ඵල, සජ්ඣායනා, ශාලාව

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

- **අංක 12 සිට 14 දක්වා ප්‍රශ්නවල හිස්තැනට වඩාත් සුදුසු පිළිතුර තෝරන්න.**

12. භික්ෂූන් වහන්සේ විහාරයට ...........................................................................
    1. වැඩියේ ය. 2. වැඩියහ. 3. වඩින ලදි. 4. වඩියි.

13. ඇතැමෙක් මහ හඬින් ................................
    1. කෑගැසුවේ ය. 2. කෑගැසුවාය. 3. කෑගැසූහ. 4. කෑගසයි.

14. සමහරු අන් අයට හිරිහැර ...........................................................................
    1. කරයි 2. කරති 3. කළේ ය. 4. කරන ලදි.

- **අංක 15 - 19 දක්වා ප්‍රශ්නවල ඉරි ඇඳි පද කවර ව්‍යාකරණ ගණයට අයත්දැයි පිළිතුරු අතරින් තෝරන්න.**

15. විනිසුරුවරයා විත්තිකරු <u>නිදොස්</u> කොට නිදහස් කළේ ය.
    1. නිපාත පදයකි. 2. උපසර්ග පදයකි. 3. සමාන පදයකි. 4. කෘදන්ත පදයකි

16. ගුරුවරයා ශිෂ්‍යයා ලවා අකුරු <u>ලියවයි</u>.
    1. විධි ක්‍රියා 2. මිශ්‍ර ක්‍රියා 3. ප්‍රයෝජ්‍ය ක්‍රියා 4. පූර්ව ක්‍රියා

17. "<u>එම්බල</u> සොර දෙටුව, තා හට මරණ දඬුවම නියම කරමි' යි. රජු කීවේය.
    1. උපසර්ග පදයකි. 2. කෘදන්ත පදයකි. 3. තද්ධිත පදයකි. 4. නිපාත පදයකි.

18. හොඳින් පාඩම් <u>කළොත්</u> විභාගය සමත් විය හැකි බව විදුහල්පතිතුමිය පැහැදිලි කළාය.
    1. පූර්ව ක්‍රියා 2. මිශ්‍ර ක්‍රියා 3. අසම්භාව්‍ය ක්‍රියා 4. අවසාන ක්‍රියා

19. <u>මම</u> හොඳ දරුවෙක් වෙමි.
    1. සමාස නාමයකි. 2. සර්ව නාමයකි. 3. තද්ධිත නාමයකි. 4. කෘදන්ත නාමයකි.

20. ' දුවයි' යන පදයේ උත්තම පුරුෂ බහුවචන පදය වන්නේ,
    1. දුවති 2. දුවමි 3. දුවමු 4. දුවහි.

21. ධීවර භාෂාවේ 'ඉයත්තුව' යනු,
    1. මුහුදු රළ ය. 2. වාරකන් කාලයයි. 3. අහස ගෙරවීමයි. 4. කාලගුණයයි.

22. 'කලත්‍රයා' යනු,
    1. මව හෝ දරුවාය. 2. ස්වාමි පුරුෂයා හෝ භාර්යාව 3. කළය හෝ යාත්‍රාව 4. ස්වාමියා හෝ සේවකයා

23. මුලින් දක්වා ඇති පදයට උදාහරණයක් <u>නොවන</u> පදය සහිත පිළිතුර තෝරන්න.
    1. යුගල පද - කියුම් කෙරුම් 3. උපමා - සඳ වැනි වත
    2. රූපක - නිල් මිණි දෑස 4. විශේෂණ පද- ළමයා

24. අකාරාදී පිළිවෙළ ප්‍රායෝගිකව භාවිතා <u>නොවන්නේ</u>,
    1. ශබ්දකෝෂවල වචන පෙළගැස්වීමේ දී. 3. පුස්තකාලයේ දී පිළිපැදිය යුතු දේ ලිවීමේ දී.
    2. දුරකථන නාමාවලි සැකසීමේ දී. 4. ඡන්ද නාමාවලි සකස් කිරීමේ දී.

25. මුලින් දී ඇති අක්ෂර වර්ගයට අයත් <u>නොවන</u> අක්ෂරය සහිත පිළිතුර තෝරන්න.
    1. කණ්ඨජ - ක, ඛ, ග, ස 3. මහප්‍රාණ - ඡ, ඨ, ඨ, භ
    2. සඤ්ඤක - ඟ, ඦ, ඬ, ඳ 4. මූර්ධජ - ෂ, ශ, ළ, ණ

26. ඇති තතු ඉක්මවා දැක්වීම.
    1. ස්වභාවෝක්තියයි. 2. අතිශයෝක්තියයි. 3. පුනරුක්තියයි . 4. පුනරුදයයි.

27. සැළලිහිණි සංදේශයේ කතුවරයා වන්නේ,
    1. වීදාගම මෛත්‍රී හිමි 2. වෑත්තෑවේ හිමි 3. තොටගමුවේ රාහුල හිමි 4. එස්. මහින්ද හිමි

28. මුලින් දී ඇති පදයට සමානාර්ථයක් <u>නොදෙන</u> පදය සහිත පිළිතුර තෝරන්න.
    1. පොළොව - මිහි 2. සක් - හත 3. අනංගයා - මල්සරා 4. සියපත - නෙළුම් මල

29. උසට ගැළපෙන මහතින් යුතු යන පදය සඳහා යෙදෙන තනි පදය වන්නේ,
    1. උස මහත 2. උස් මිටි 3. ආරෝහණ අවරෝහණ 4. ආරෝහපරිණාහ

30. කුමාරතුංග මුනිදාසයන් ළමයින් සඳහා ලියූ පොතක් <u>නොවන්නේ,</u>
    1. හත්පණ 2. හීන් සැරය 3. මඩොල් දූව 4. කියවන නුවණ

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

## II කොටස

- **සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

(01) **පහත සඳහන් මාතෘකා වලින් එකක් තෝරා ගෙන වචන 200 ට නොඅඩු වන සේ වාක්‍ය රචනාවක් ලියන්න.**

(අ.)අප බොහෝ විට හුරු වී ඇත්තේ ස්වභාවික තත්ත්වයෙන් තොර කෘතීම ආහාර ගැනීමටය. මේ නිසා අද වන විට බොහෝ ලෙස රෝග වලට ජනයා සීග්‍රයෙන් ගොදුරු වෙමින් පවතී. " නිරෝගී දිවියක් සඳහා දේශීය ආහාර වලට හුරු පුරුදු වෙමු" යන මාතෘකාව යටතේ රචනයක් ලියන්න.

(ආ.) අපේ ගැමි සුවඳ රැඳී ඇත්තේ ජනකවි තුළය. ජන කවියේ වටිනාකම රැඳී ඇත්තේ අපේ අතීත මුතුන් මිත්තන්ගේ බුද්ධිමත් බව නිසාවෙනි. එමෙන් ම සරල බව, රසවත් බව හා අව්‍යාජ බව නිසා සෑම කල්හි ම ජන කවි ජනයා අතර ජනප්‍රියතාවයෙන් යුතුය." නොනැසී පවතින අපේ ජන කවි" යන මාතෘකාව යටතේ රචනයක් ලියන්න.

(ඉ.) ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍යයක් වන රූපවාහිනිය තුළින් අද වන විට ළමා පරපුර වෙත පිදෙන හිතකර දෑ මෙන්ම අහිතකර දෑ ද බොහෝ ය. දරුවන් වන අප විසින් එයින් ලැබෙන්නා වූ අහිතකර දේ ඉවතලමින් හිතකර දේ පමණක් ලබා ගැනීමට උත්සුක විය යුතුය. " රූපවාහිනිය හා ළමා පරපුර" යන මාතෘකාව යටතේ රචනාවක් ලියන්න.

(ඊ.)යහළුවන්ගෙන් මිදුණු මම වනයේ ඈතට පියමං කළෙමි. ඔවුන් ඉන්නා ඉසව්වක් මට මතක නැත. රූස්ස ගස් කොළන්, ගස් වටා එතුණු මහ වැල් මට මැවී පෙනුණෙ අවතාර ලෙසිනි. මෙතැන් සිට කතාවක්ගොඩනගන්න. සුදුසු මාතෘකාවක් යොදන්න. (ලකුණු 20 )

(02) **පහත සඳහන් පාඨයන්හි අවස්ථා සම්බන්ධය ලියන්න.**

පාඩම - කවුරුන් විසින් කා හට කියන ලද්දක් ද යන්න ලියා දක්වන්න.

i. "මෑණියනි, අප මේ පැමිණියේ සමන්තකූට පර්වතය අසල පිහිටි රත්නපුර නගරයටය. ගමනේ දුෂ්කර කොටස ඇත්තේ ඉදිරියටය".

ii. "තරහ ගන්න එපා සර්! අපි මේ කරන්නෙත් අසරණ දරුවන්ගේ ඉගෙනීමට උදව් දීමක් තමා"

iii. "මහත්තයා කිව්වා තරගෙට යන්නේ දිනන්නම නෙවෙයි කියලා. මේ ඉස්කෝලෙත් ඒ තරගෙට ඉදිරිපත් කරන්න ලැබුණු එකත් ලොකු දිනුමක් ලු. "

iv. "ඉදින් මූ තුමූ පළමු වයස දී වස්තුව නොනසා කෘෂි වණික් ආදී කටයුත්තක යෙදූ නම් මෙම නුවර නායක සිටු තනතුරු ලැබෙති."

v. "තා බොරු කිව්වොත්, තට කවදාවත් නිදහස ලැබෙන්නේ නෑ. තගේ කට පුළුස්සනවා රත් කරපු යකඩෙකින්" (ලකුණු 3 x 5 = 15 )

(03)
ඇසෙන්නේ කා - කා හඬ සෑම පැත්තෙන්
නැගෙව් කියන්නා වැනි දූන්ම නින්දෙන්
දොරින් අඩක් මේ ඇරියාම එන්නේ
සිසිල් සුළඟ ආයුබෝවන් කියා මෙන්

පියා හඹත් කුඩු වලින් කුරුල්ලෝ
ඉතාම මිහිරියි හඬ දූන් ඔවුන්ගේ
සුළං වැදීමෙන් උදයේ සිසිල් වූ
අලුත් පණක් ගස් වලටත් ලැබීලා

දිසා වෙනැයි මේ හිරු එන්නේ පායා
හැරී සිටී සූරියකත් ගසේ මල්
රුසුයි දිලෙන්නේ ලනු මෙන් ඇදීලා
මඟුල් ගෙයක් දෝ ලොව මේ වෙලාවේ

1. කවියේ සඳහන් වන්නේ දවසේ කුමන වේලාවක් ගැනද?
2. කපුටා කෑ ගසන්නේ කුමන අරමුණකින් ද?
3. ගස් වලට නව පණක් ලැබුණේ කෙසේද?
4. සූරියකාන්ත මල් දෙන පණිවිඩය කුමක් ද?
5. මෙහි සඳහන් උපමා දෙකක් ලියන්න. (ලකුණු 2 x 5 = 10)

(04) **පහත සඳහන් ජේදය වචන 20-25 ත් අතර වන සේ සාරාංශ කර ලියන්න. පිළිතුර අග වචන සංඛ්‍යාවද ලියා දක්වන්න.**

මම මීට පූර්ව ජාතියෙහි කිසි වස්තුවක් නැතිව, අනුන්ට මෙහෙ කොට ජීවත් වන්නා වූ දුප්පත් මිනිසෙක් වෙමි. එකල මම හදාව හා සමඟ කළවිට සලා, යම්තම් වී ටිකක් ලැබ, ණයට දී, පොළී කොට ගෙන, මෙසේ වරින් වර පොළී උපදවා ගෙන, ක්‍රමයෙන් දැසි දස් ගවමහීෂාදීන් හා ධන ධාන්‍යාදියෙන් සමෘද්ධි ව වසන්නා වූ ආ දෙ දෙන ශ්‍රද්ධාධනයෙන් සැරහී දන් දෙන්නමෝ, සිල්වත් ගුණවත් භික්ෂූන් වහන්සේ ම පරීක්ෂා කොට, ආරාධනයෙන් කැඳවා ගෙන අවුත්, මධුර වූ අන්නපානාදියෙන් හා සිවුරු සෙනසුන් ආදියෙන් බුද්ධ පූජා කරවීමු. (ලකුණු 10)

(05) තරුණ සමාජ කාර්යාලයකට ළඟදී මිල දී ගත් රෝනියෝ මුද්‍රණ යන්ත්‍රය ක්‍රියා විරහිතව ඇත. එය මිල දී ගෙන ඇත්තේ වසර දෙකක් තුළ ක්‍රියා විරහිත වුවහොත් අලුත්වැඩියා කර දීමේ පොරොන්දුව මතය. ඔබ තරුණ සමාජයේ ලේකම්වරයා යයි සිතා කොළඹ 07 සීකෝ ප්‍රින්ටින් ආයතනයේ අධ්‍යක්ෂවරයාට ඒ බව දන්වා යවන ලිපිය ලියන්න. (ලකුණු 15)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# තෙවන වාර පරීක්ෂණය - 2019

## සිංහල භාෂාව හා සාහිත්‍යය

09 ශ්‍රේණිය

## පිළිතුරු පත්‍රය

## I කොටස

| | | |
|---|---|---|
| 01 - 3 | 11 - 1 | 21 - 4 |
| 02 - 2 | 12 - 2 | 22 - 2 |
| 03 - 1 | 13 - 3 | 23 - 4 |
| 04 - 2 | 14 - 2 | 24 - 3 |
| 05 - 3 | 15 - 2 | 25 - 4 |
| 06 - 4 | 16 - 3 | 26 - 2 |
| 07 - 4 | 17 - 4 | 27 - 3 |
| 08 - 4 | 18 - 3 | 28 - 2 |
| 09 - 3 | 19 - 2 | 29 - 4 |
| 10 - 2 | 20 - 3 | 30 - 3 |

## II කොටස

(02) i. ශ්‍රී පාදය වැන්ද වූ හැටි
බාල පුතා විසින් තම මවට / සිටු දියණියට

ii. දිට්ඨ දාන
සෞඛ්‍ය පරීක්ෂකතුමා විසින් විදුහල්පතිතුමාට

iii. රස විඳිනා - දැනුම මනා
මුදලිහාමි විසින් තම මවට / අම්මාට

iv. මහධන සිටුපුත්හුගේ වස්තුව
බුදුරජාණන් වහන්සේ විසින් ආනන්ද මහ තෙරුන් වහන්සේට

v. මහාසාර පළඳනාව
රජතුමා විසින් ගැමියාට

(03) 1. උදේ කාලය / අළුයම් කාලය
2. දූන් ම නින්දෙන් පිබිදෙන්න කියා
3. උදේ සිසිල් සුළං වැදීමෙන්
4. හිරු නැගෙන දිසාව දැක්වීම.
5. ◆ සුළඟ ආයුබෝවන් කියා මෙන්
◆ රැස් ලුනු මෙන් ඇඳිලා